*සැ. යු. -* 2022.07.22 වැනි දින පළ වූ අංක 2290 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,291 - 2022 ජූලි මස 29 වැනි සිකුරාදා - 2022.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1300 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1303 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1304 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1307 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1310 |


***සැ. යු.-*** (i) නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත, 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ඇටර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත, 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අගෝස්තු මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අගෝස්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - බදුල්ල**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2022.08.13 වැනි සෙනසුරාද දින පෙ. ව. 10.00** සිට බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් පාන්නන් සිටියි නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

03. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නා ගැනුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්යය වේ.

04. භාණ්ඩ මිල දී ගැනීම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

05. මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසි දින ප. ව. 4.30 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ඩබ්ලිව්. එන්. ද සිල්වා,
මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු.

2022 ජූලි මස 18 වැනි දින,
බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2022.08.13 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියට යෝජිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 1. | 49510 | සාස්පාන් 02 |
| 2. | අංක රහිත | මුට්ටි 01 |
| 3. | 50477 | මුට්ටි 01 |
| 4. | අංක රහිත | සිදුරු සහිත මුට්ටි 01 |
| 5. | අංක රහිත | සිදුරු සහිත සාස්පාන් 01 |
| 6. | 50060 | ප්ලාස්ටික් කළ 01 |
| 7. | 47085 | සිදුරු සහිත සාස්පාන් 01 |
| 8. | අංක රහිත | මුට්ටි 01 |
| 9. | 43474 | මුට්ටි 01 |
| 10. | 48397 | මුට්ටි 01 |
| 11. | 48058 | ගෑස් ලිප් 01 |
| 12. | 44232 | ගෑස් ලිප් 01 |
| 13. | අංක රහිත | ගෑස් ලිප් 01 |
| 14. | 48799 | මුට්ටි 01 |
| 15. | අංක රහිත | ගෑස් ලිප් 01 |
| 16. | 45135 | ගෑස් ලිප් 01 |
| 17. | 86962 | ගෑස් ලිප් 01 |
| 18. | 33426 | ගෑස් ලිප් 01 |
| 19. | 48814 | ගෑස් ලිප් 01 |
| 20. | 40887 | ගෑස් ලිප් 01 |
| 21. | අංක රහිත | ගෑස් ලිප් 01 |
| 22. | අංක රහිත | ගෑස් ලිප් 01 |
| 23. | 49373 | ගෑස් ලිප් 01 |
| 24. | අංක රහිත | තරාදි 01 |
| 25. | අංක රහිත | තරාදි 01 |
| 26. | අංක රහිත | තරාදි 01 |
| 27. | 48815 | මුට්ටි 01, සාස්පාන් 01 |
| 28. | 35444 | සිදුරු සහිත මුට්ටි 01 |
| 29. | අංක රහිත | කළ 01 |
| 30. | 48511 | සිදුරු සහිත මුට්ටි 01 |
| 31. | 48794 | මුට්ටි 01. සිදුරු සහිත සාස්පාන් 01 අඩු සහිත සාස්පාන් 01 |
| 32. | 41609 | ඇලුමිනියම් කළ 01 |
| 33. | 44816 | මුට්ටි 01 |
| 34. | 44232 | බේසම් 01 |
| 35. | අංක රහිත | සිදුරු සහිත මුට්ටි 01 |
| 36. | 48397 | මුට්ටි 01 |
| 37. | අංක රහිත | සිදුරු සහිත මුට්ටියක කොටසක් |
| 38. | අංක රහිත | සවල් 01 |
| 39. | 40181 | මුට්ටි 01, සාස්පාන් 01, සිදුරු සහිත මුට්ටි 01 |
| 40. | අංක රහිත | ඇලුමිනියම් කළ 01 |
| 41. | 47278 | මුට්ටි 01 |
| 42. | 42618 | මුට්ටි 01 |
| 43. | 47774 | මුට්ටි 01 |
| 44. | 48811 | මුට්ටි 03, සාස්පාන් පියන් 02 |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 45. | 42615 | ඇලුමිනියම් කළ 01 |
| 46. | අංක රහිත | සිදුරු සහිත මුට්ටි 01 |
| 47. | 44816 | සිදුරු සහිත සාස්පාන් 01 |
| 48. | 47735 | මුට්ටි 01 |
| 49. | අංක රහිත | මුට්ටි 01 |
| 50. | 92759 | ගැරුම් වට්ටි 01 |
| 51. | 35447 | ගැරුම් වට්ටි 01 |
| 52. | 49126 | සවල් 01 |
| 53. | 49118 | සවල් 01 |
| 54. | 50833 | සවල් 01 |
| 55. | අංක රහිත | උදලු 01 |
| 56. | 46597 | සවල් 01 |
| 57. | 48788 | සවල් 01 |
| 58. | 48790 | සවල් 01 |
| 59. | අංක රහිත | සවල් 01 |
| 60. | 50718 | සවල් 01 |
| 61. | අංක රහිත | සවල් 01 |
| 62. | 49401 | සවල් 01 |
| 63. | අංක රහිත | සවල් 01 |
| 64. | අංක රහිත | කල්දේරම් 01 |
| 65. | අංක රහිත | මුට්ටි 01 |
| 66. | අංක රහිත | අලවංගු 01 |
| 67. | 45541 | උදලු 01 |
| 68. | අංක රහිත | ගැරුම් වට්ටි 01, කැටකුඩ 02 |
| 69. | 47912 | වක් පිහි 01 |
| 70. | අංක රහිත | වක් පිහි 01 |
| 71. | අංක රහිත | වක් පිහි 01 |
| 72. | අංක රහිත | වක් පිහි 01 |
| 73. | අංක රහිත | වක් පිහි 01 |
| 74. | අංක රහිත | ස්කුරුප්පු නියන් 01 |
| 75. | අංක රහිත | ස්කුරුප්පු නියන් 01 |
| 76. | අංක රහිත | විදුලි ඉස්තිරික්ක 01 |
| 77. | 96586 | අත් ට්‍රැක්ටර් බෙල්ට් |
| 78. | අංක රහිත | උදලු 01 |
| 79. | 20734 | කැති 01 |
| 80. | අංක රහිත | පිහි 01 |
| 81. | 50689 | හොකී පිති 01 |
| 82. | අංක රහිත | බෙහෙත් ඉසින ටැංකි 01 |
| 83. | අංක රහිත | 2.5kg ප්‍රමාණයේ නිල් පැහැති ගෑස් සිලින්ඩර් 01 |
| 84. | 75198 | අත් ට්‍රැක්ටර් 01 |
| 85. | 31767 | UPTP 4707 යතුරු පැදි 01 |

07-642

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හිඟුරක්ගොඩ

### අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන, කල්තබා ගත නොහැකි නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන, කල්තබා ගත නොහැකි භාණ්ඩ **2022.08.20** වැනි දින පෙ. ව. **9.30** ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, වෙන්දේසිය පවත්වනු ලබන දින, වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්තුමියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිළ දී ගැනීමට එන සෑම අයකු ම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. භාණ්ඩ මිළ දී ගැනීම මුදලින් කළ යුතු අතර, මිළ දී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ දී ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය

සැ. යු. - රටේ පවතින සෞඛ්‍යමය තත්ත්වය හේතුකොට ගෙන අදාළ සෞඛ්‍ය විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම අනිවාර්ය වේ.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2022 ජූලි මස 20 වැනි දින,
හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ප්‍රසිද්ධ වෙන්දේසිය - 2022.08.20**

| අනු. අංකය | නඩු අංකය | පී.ආර්. අංකය | අදාළ භාණ්ඩ |
|---|---|---|---|
| 1. | 65701 | 880/19 | ගෑස් සිලින්ඩර් 01 (12.05kg) |
| 2. | 72587 | | ශීතකරණ 01 |
| 3. | 72986 | | වක්පිහි 01 |
| 4. | 7961 | | විදුලි පන්දම් 02 |
| | | | ජංගම දුරකථන 02 |
| | | | පිහි 01 |
| 5. | 31100 | | විදුලි පන්දම් 01 |
| | | | ජංගම දුරකථන 02 |
| 6. | 52067 | | පිහි 02 |
| | | | විදුලි පන්දම් 03 |
| | | | ගමන් මලු 02 |
| | | | ජංගම දුරකථන 02 |
| | | | පාවහන් යුගල 03 |
| 7. | 85244 | 254/21 | උදලු 01 |
| | | | සවල් 02 |
| | | | අලවංගු 02 |
| | | | කුළු ගෙඩි 02 |
| | | | චේන් බ්ලොක් 01 |
| 8. | 79019 | | උදලු 01 |
| 9. | 84942 | | පිහි 01 |
| | | | කැති 01 |
| 10. | 81790 | | පොරොව 01 |
| 11. | 81837 | | කැති 01 |
| 12. | 81840 | | පිහි 01 |
| 13. | 81811 | | කැති 01 |
| 14. | 81808 | | පොරොව 01 |
| 15. | 81839 | | ප්ලාස්ටික් බාල්දි 01 |
| 16. | 81809 | | පොරෝ 01 |
| 17. | 79018 | | උදලු 01 |
| 18. | 79017 | | උදලු 01 |
| 19. | 66586 | 452/19 | කැති 01 |
| 20. | 69563 | | ඔරු 01 |
| | | | කොල්ලෑ 01 |
| | | | හබල් 02 |
| 21. | 83128 | 2238/21 | සවල් 01 |
| 22. | 86596 | | විදුලි පන්දම් 02 |
| | | | පිහි 01 |
| | | | කුලු ගෙඩි 01 |
| | | | ඉල්ලන් කුරු 05 |
| | | | සෙරෙප්පු යුගල 01 |
| | | | සපත්තු යුගල 01 |
| 23. | 79999 | | සවල් 01 |
| | | | උදලු 01 |
| | | | ප්ලාස්ටික් බූලි 02 |
| 24. | 85826 | | කටුකම්බි සහිත රෝල් 02 |
| | | | පිහි 01 |
| 25. | 66414 | 1000/19 | කිලෝ 5 ගෑස් සිලින්ඩර් 01 |
| | | | ගෑස් ලිප් 01 |
| 26. | 76787 | | සවල් 01 |
| 27. | ඒ. ආර්. 427/21 | | පොරෝ 01 |
| 28. | 86729 | | කැති 01 |
| 29. | 38339 | 148/15 | ජංගම දුරකථන 01 |
| 30. | 82314 | 1348/20 | ජංගම දුරකථන 01 |
| 31. | 85298 | 167/22 | සවල් 01 |
| 32. | 85484 | 189/22 | සවල් 01 |
| 33. | 86050 | 368/22 | සවල් 01 |
| 34. | 86332 | 365/22 | සවල් 01 |
| 35. | 86775 | 492/21 | සවල් 01 |
| 36. | 82331 | 1201/21 | සවල් 01 |
| 37. | 85412 | 254/22 | සවල් 01 |
| 38. | 85167 | 116/22 | යකඩ බාල්දි 01 |
| 39. | 84946 | | පොරෝ 01 |
| 40. | 82320 | | උදලු 01 |
| 41. | 82578 | | පිහි 01 |
| 42. | 85825 | | පිහි 04 |
| 43. | 82332 | | විදුලි පන්දම් 02 |
| 44. | 74132 | 253/19 | පොරෝ 01 |
| | | | මිටි 01 |
| | | | නියන් 01 |
| 45. | අංක රහිත | | වැලි කියුබ් 25 |
| 46. | අංක රහිත | | බොරලුපස් කියුබ් 20 |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

### රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2023 වර්ෂය

**බලංගොඩ අංක 01 - රා තැබෑරුම**

2023 ජනවාරි මස 01 වැනි දින සිට 2023 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාල සීමාව තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශයන්හි පැසුණු රා සිල්ලරට විකිණීම පිණිස ටෙන්ඩර් කැඳවනු ලැබේ.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව; හා

(ii) සුරා බදු නිවේදනයේ දැක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි ම බලපාන කරුණු කොන්දේසි මාලාවට යටත් ය.

02. සෑම ටෙන්ඩරයක් වෙනුවෙන් ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ලංකා බැංකු ශාඛාවකින් මුදල් තැන්පත් කළ බවට ලදුපතක් ටෙන්ඩරයට අමුණා එවිය යුතු ය. පෝරම ගාස්තුව රු. 1,500.00 කි.

03. ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ද, කොළඹ සුරාබදු කොමසාරිස් ජනරාල් කාර්යාලයෙන් ද, ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත්‍රය, කවරයක බහා සීල් තබා ඉහළ වම් කෙළවරේ කුමන තැබෑරුමක් සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩරයක් ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් වැසීමට කාලය ඉකුත් වීමට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, බලංගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. සෑම ටෙන්ඩර්කරුවෙක් ම තමාගේ නමින් ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

05. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩරයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අය විසින් සාමූහිකව ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

06. ටෙන්ඩර් කරන මුදල් ඉලක්කමෙන් සහ අකුරෙන් සඳහන් කළ යුතු ය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ අත්සන හා දිනය යොදා සහතික කළ යුතු ය. සෑම ටෙන්ඩරයක්ම සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් ද අත්සන් කළ යුතු ය. මෙම අවශ්‍යතාවයන් අනුකූල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කළ හැකි ය.

07. ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිල දී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින් රා රේන්දය විකිණීමේ කොන්දේසියට අත්සන් තබා බලංගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරන ලද මුදල ඇප වශයෙන් තැන්පත් කළ යුතු ය.

08. 2022.09.08 වැනි දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර්පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකී නියමිත වේලාවට බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

09. **2022.09.08 වැනි දින** ටෙන්ඩර් විකිණීම අසාර්ථක වුවහොත් **2022.10.10 වැනි දින පෙ. ව. 10.30** දක්වා නැවත විකිණීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

10. කිසිදු හේතුවක් නොදන්වා කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ස්වකීය අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය බලංගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

11. 2022 වර්ෂයේ දැනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථානය ලබා ගත හැකිදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු වේ. ගොඩනැගිලි සොයා දීමට බලපත්‍ර අධිකාරී බැඳී නොමැති බව ද සැලකිය යුතු ය.

12. සෑම මසකම වාරිකය ගෙවීමෙන් පසු ගෙවූ බවට මුද්‍රා තැබීමෙන් අනතුරුව පමණක් බලපත්‍රය එම මාසය සඳහා වලංගුවන අතර නොඑසේනම් බලපත්‍රය අවලංගු වූ වා සේ සළකා කටයුතු කරනු ලැබේ.

13. වැඩි විස්තර බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැන ගත හැකි ය.

එච්. එම්. එච්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2022 ජූලි මස 11 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *පිහිටි ස්ථානය* | *තැබෑරුම විවෘත කර තැබිය හැකි වේලාවන්* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| බලංගොඩ අංක 01 රා තැබෑරුම | බලංගොඩ | බලංගොඩ නගර සභා සීමාව තුළ | පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 9.00 දක්වා | 2022.09.08 වැනි දින පෙ.ව. 10.30 |

07-551

# රජයේ නොවන දැන්වීම්

## දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : ඊස්ට් වෙස්ට් කනෙක්ෂන්ස් බියුටි ඇන්ඩ් එලිගන්ස් සැලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : පී. වී. 00226732

ලියාපදිංචි ලිපිනය : නො. 16, 3/3, ෆැල්කන් කෝට්, අමරසේකර මාවත, කොළඹ 05

සංස්ථාගත දිනය : 2020 සැප්තැම්බර් 01 වැනි දින.

07-550

## ඇටර්නි බලය අවලංගු කිරීම

කාක්කපල්ලිය, සේමාඉරිප්පුව හි පදිංචිව සිට මේ වන විට Cimitero Vecchio, 9 Schio, 36015, Vicenza, Italy හි වෙසෙන කුරුප්පු අප්පුහාමිලාගේ සුජානි අනුරුද්දිකා වන මම 2017.05.29 වැනි දින ඉතාලි රාජ්‍යයේ මිලාන් හි ශ්‍රී ලංකා තානාපති ඉදිරියේ බංගදෙනිය, කෝට්ටපිටිය, අංක 86 හි පදිංචි මිහිඳුකුලසූරිය ප්‍රියංකා නාමලි ප්‍රනාන්දු (ජාතික හැඳුනුම්පත් අංක 707983604 V) යන අයට පවරන ලද ඇටර්නි බලපත්‍රය සහ ඒ හා සම්බන්ධ කටයුතු මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි සියලු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මින් මතුවට මිහිඳුකුලසූරිය ප්‍රියංකා නාමලි ප්‍රනාන්දු යන අය විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ක්‍රියා සඳහා මාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බව වැඩිදුරටත් මම මෙයින් දිවුරා ප්‍රකාශ කර සිටිමි.

කුරුප්පු අප්පුහාමිලාගේ සුජානි අනුරුද්දිකා.

07-610

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පැක්ස්ඩැක් එක්ස්චේන්ජ් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගමේ නාමය හයිපර්ස්වැප් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කර වර්ෂ 2022 ක් වූ ජුනි මස 16 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ කලින් නම : පැක්ස්ඩැක් එක්ස්චේන්ජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 00219777
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 21/3, දෙවන පටුමග, කඩලාන, මොරටුව
සමාගමේ අලුත් නම : හයිපර්ස්වැප් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව

ඒෂියන් කෝපරේට් සෙක්‍රටරීස් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි ලේකම්වරු.

07-622/1

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ අරවානි විලා (පීවීටී) එල්ටීඩී යන සමාගමේ නාමය සතිආනා විලා (පීවීටී) එල්ටීඩී වශයෙන් වෙනස් කර වර්ෂ 2022 ක් වූ ජුනි මස 15 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ කලින් නම : අරවානි විලා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 00225629
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 584/3, මීගමු පාර, වත්තල
සමාගමේ අලුත් නම : සතිආනා විලා (පීවීටී) එල්ටීඩී

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

ඒෂියන් කෝපරේට් සෙක්‍රටරීස් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි ලේකම්වරු.

07-622/2

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සැමජය මයික්‍රෝ ක්‍රෙඩිට් (පීවීටී) එල්ටීඩී යන සමාගමේ නාමය සැමජය මයික්‍රෝ කැපිටල් (පීවීටී) එල්ටීඩී වශයෙන් වෙනස් කර වර්ෂ 2022 ක් වූ ජුනි මස 16 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ කලින් නම : සැමජය මයික්‍රෝ ක්‍රෙඩිට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 00229690
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 805/3, පළවන මහල, වැව පාර, මහරගම.
සමාගමේ අලුත් නම : සැමජය මයික්‍රෝ කැපිටල් (පීවීටී) එල්ටීඩී

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව

ඒෂියන් කෝපරේට් සෙක්‍රටරීස් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි ලේකම්වරු.

07-622/3

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාජගිරිය, මැදවැලිකඩ, අංක 19 හි පදිංචි පුෂ්පා ධම්මිකා මැන්දිස් වික්‍රමසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 807550209 V) වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කෞශල්‍යා නිල්මිණි විජේසිංහ විසින් ලියා සහතික කළ අංක 1390 - 2016 ක් වූ ජුනි මස 03 වන දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු වශයෙන් රාජගිරිය, මැදවැලිකඩ, කමතවත්ත පාර, අංක 19 හි පදිංචි සමන් ප්‍රියන්ත මැන්දිස් වික්‍රමසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 782240269 V) යන අය පත්කළ අතර, 2021.11.26 වැනි දින පටන් බලපැවැත්වෙන පරිදි එය බල රහිත කර අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙන අතර, මාගේ ඇටර්නි බලකරු වශයෙන් ඔහු විසින් මෙතැන් පටන් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බව ද මෙයින් දැනුම් දෙමි.

පුෂ්පා ධම්මිකා මැන්දිස් වික්‍රමසිංහ.

2021.11.26

07-623

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 534 බී, සීලරතන මාවත, හොරණ හි පදිංචි චමත් හේම් ප්‍රසාද් අභයවික්‍රම (ජා. හැ. අ. 197710500050) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ එහි පොදු මහජනතාව වෙත දැනුම් දෙන වගනම් දෙල්කඳ නුගේගොඩ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද හොරණ ප්‍රසිද්ධ නොතාරිස් එස්. නිරෝෂා හඳරාගම විසින් ලියා සහතික කරන ලද අංක 4 ඒ, වල්පිට හොරණ ස්ථානයේ පදිංචි කඹුරුපිටිය ආරච්චිගේ සුරංජි ඉරේෂිකා (ජා. හැ. අ. 788210140 V) වෙත ලබාදී ඇති 1223 හා 2018.08.09 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් මින් ඉදිරියට ඉහත කී ඇටර්නි බලපත්‍රය යටතේ සිදු කරන කිසිදු ගණුදෙනුවක් සම්බන්ධව මා විසින් වග නොකියන බවත් ප්‍රකාශ කරමි.

චමත් හේම් ප්‍රසාද් අභයවික්‍රම.

2018.08.09

07-624

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාලඹේ, මිහිඳු මාවත, අංක 566/1 හි (දැනට් කුවේට් හි ෆර්වානියා, බ්ලොක් 3 පදිංචි) පදිංචි ඉඩන්ගොඩ චතුරිකා නිශාදිනී (ජා. හැ. අ. 825620141 V හිමි) වන මම 2019 දෙසැම්බර් මස 08 වැනි දින කුවේට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ කවුන්සලර් කෙත්මා රාජපක්ෂ යාපා විසින් ලියා සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් මාලඹේ, මිහිඳු මාවත, අංක 566/1 හි පදිංචි

පැල්පොල ලොකු ලියනගේ ශ්‍රියානි පද්මකාන්ති අල්විස් (ජා. හැ. අ. 608292225 V ) යන අය වෙත පවරන ලද විශේෂ ඇටර්නි බලය හා ඒ සම්බන්ධ කටයුතු මෙයින් අවලංගු කොට නිශ්ප්‍රභා කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි සියළු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මින් මතුවට පැල්පොල ලොකු ලියනගේ ශ්‍රියානි පද්මකාන්ති අල්විස් විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ක්‍රියා සඳහා මාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බව වැඩිදුරටත් මෙයින් දිවුරා ප්‍රකාශ කර සිටිමි.

ඉඩන්ගොඩ චතුරිකා නිශාදිනී.

2022 ජූලි මස 18 වැනි දින.

07-644

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 533 වැව පාර බොරලැස්ගමුව පදිංචි නලින් තිළිණ කුමාර කන්නන්ගර (ජා. හැ. අංක 542 183 268 V) වන මා විසින් අංක 68/18 එගොඩවත්ත පාර බොරලැස්ගමුව පදිංචි උඩුවිදනලාගේ කාන්ත ශ්‍රී ජනත් කුමාර උඩුවිදාන (ජා. හැ. අංක 582683565 V) යන අය වෙත, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දොන් මැනුවල්ගේ දොන් ඩොනල්ඩ් පුෂ්පකුමාර ශ්‍රී ජයවර්ධන විසින් 2022 මාර්තු මස 19 වැනි දින ලියා සහතික කරන ලද අංක 4330 දරන ඇටර්නි බලපත්‍රයෙන් ලබා දෙන ඇටර්නි බලය මෙයින් අවලංගු කරන ලද බවත් අද පටන් ඉහත කී ඇටර්නි බලකරයේ වලංගු තාවයක් බලපැවැත්මක් නොමැති බවත් උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

නලින් තිලිණ කුමාර කන්නන්ගර.

07-651

---

## සීමිත සමාගම් ඒකාබද්ධ කිරීමේ පොදු නිවේදනය

ඇලුමෙක්ස් පීඑල්සී (සමාගම් අංක පීවී PV 539 PQ) සහ ඇල්කෝ ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක PV 72405)

ඇලුමෙක්ස් පීඑල්සී (සමාගම් අංක PV 539 PQ) ඇල්කෝ ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක PV 72405) යන සමාගම් ද්විත්වය 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව, සමාගම් පනතේ 242 (3)(b) වැනි ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද නව සමාගමේ නාමය ඇලුමෙක්ස් පීඑල්සී වන අතර සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල්වරයා විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන දිනයේ දී ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක වේ.

ඒකාබද්ධ වීමෙන් පසු ඇලුමෙක්ස් පීඑල්සී සමාගමේ ලියාපදිංචි කාර්යාලය, සපුගස්කන්ද, මාකොළ ලෙස දක්වේ.

සමාගම් ඒකාබද්ධ කිරීමේ යෝජනාව අදාළ සමාගම් හි ඕනෑම කොටස් හිමියෙකුට, ණය හිමියෙකුට හෝ ඒ සඳහා බැඳී සිටින ඕනෑම අයෙකුට, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 ස්ථානයේ දී සාමාන්‍ය කාර්යාල වේලාවන්හි පරීක්ෂා කළ හැක.

ඇලුමෙක්ස් පීඑල්සී සහ
ඇල්කෝ ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අධ්‍යක්ෂ මණ්ඩලයන්හි නියමය පරිදි ලේකම්වරු.

2022 ජූලි 18 වැනි දින,
400, ඩීන්ස් පාර,
කොළඹ 10.

07-657

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කඳාන, රිලවුල්ල, පැන්වලියන් මාවත, අංක 25/2 හි ජාතික හැඳුනුම්පත් අංක 196683600815 හිමි පෝරුතොටගේ රේණුකා ප්‍රියදර්ශි ප්‍රනාන්දු වන මම, ම විසින් කඳාන, රිලවුල්ල, මෝලවත්ත පාර, අංක 141/2A හි අතුකෝරාළ ආරච්චිගේ ජෙරී ශ්‍රියාන් ඇන්ටන් ප්‍රනාන්දු යන අයට මා වෙනුවෙන් කටයුතු කිරීමට බලය පවරමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පියසිරි මොරපිටිය මහතා විසින් 2010.05.02 දින ලියා සහතික කළ අංක 3141 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මා සම්බන්ධයෙන් මෙතැන් පටන් අවලංගු කරන බව ද මෙයින් දැනුම් දෙමි.

අද පටන් ඉහත කී විශේෂ ඇටර්නි බලපත්‍රය භාවිතා කරමින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් මින් පසු වලංගු නොවන බව ද මා ඊට කිසිදු වගකීමක් නොදරන බව ද මෙයින් දැනුම් දෙමි.

පෝරුතොටගේ රේණුකා ප්‍රියදර්ශී ප්‍රනාන්දු.

07-665

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් තැබෑරුම**

2022/2023 වර්ෂය සඳහා වූ රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගු සැම සුරා බදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත්, මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් **2022.08.26 වැනි දින පෙ.ව. 10.30** වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැළකිලිමත් විය යුතු ය :-

1. ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය ;
2. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සාක්ෂිකරුවන් අත්සන යොදා තිබිය යුතු ය ;
3. සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් වෙනුවෙන් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙකී අවශ්‍යතාවයන් ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය -

*(අ)* ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,
*(ආ)* වත්කම් සහතිකය.

සමග ලියුම් කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම්පස කෙළවරෙහි ඉහළින් තැබෑරුම් අංක සහ නම සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන 2022.08.26 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලංසු සුරක්ෂණ මුදල තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පතක් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

07. සියලුම මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රලත් ස්ථානවල විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරන ලද බව සැළකිය යුතු ය.

08. ආරක්ෂිත හේතුවක් මත හෝ රජය මගින් නිකුත් කරනු ලබන හෝ වෙනත් යම් කරුණක් මත හෝ විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තබන කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

09. මීට පෙර විදේශ මත්පැන් සැලක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රජයට යම් මුදලක් ගෙවීමට තිබේනම් ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රථම එම හිඟ මුදල ගෙවා නිම කළ යුතු ය.

10. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකි ය.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2022 ජූලි මස 22 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

***මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කළ විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව - 2022/2023 වර්ෂය***

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම විවෘත කර තබන කාලය සහ වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|
| 24 විදේශ මත්පැන් තැබෑරුම | දෙල්තොට | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2022.08.26 වැනි දින පෙ.ව. 10.30 දක්වා |
| " | | | | |

ටෙන්ඩරය හිමිවන තැනැත්තා එකී මුදල මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 1,000.00 ක් වේ.

07-666

---

**නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2022-2023 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව 2022-2023 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් **2022.09.16 වැනි දින පෙ. ව. 10.30** දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් මගින් ඉදිරිපත් කළ යුතු ය;

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය.

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතුය.

*(ඈ)* ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය :-

(1) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේදී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය;

(2) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව, ජාතික හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතුය;

(3) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය;

(4) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝරම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය හා නම් සඳහන් කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන්වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප.ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. මෙම මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් නමින් නුවරඑළිය ලංකා බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කීහිප දෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවළුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුයි.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් **2022.10.17 වැනි දින පෙ.ව. 10.30** ට මෙම ස්ථානයේ දී නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මගේ තීරණය අවසාන තීරණය වේ.

11. ටෙන්ඩ විකිණීමට අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ හැකිය.

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2022 ජූලි මස 21 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නුවරඑළිය.

***උපලේඛනය***

***විදේශ මත්පැන් තැබෑරුම්***

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාර ගන්නා දිනය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| අංක 01- නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභා අංක 06 කොට්ඨාසය තුළ | 2022.09.16 | පෙ.ව. 10.30 | රු. 5,000 |

07-670

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී (මීගමුව ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

**අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කොච්චිකඩේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ව්‍යාපාර ලියාපදිංචි අංක W-13410 දරන පී. වී. එස්. ස්ටීල් යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොච්චිකඩේ පදිංචි එමිල් මනෝරාජ ප්‍රනාන්දුපුල්ලේ සහ නැගෙනහිර නයිනමඩම පදිංචි කුරුකුලසූරිය අරුන ජ්ලැසිඩල් ගිහාන් ප්‍රනාන්දු යන අය බැඳුම්කරු /උකස්කරු වශයෙන් මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. කොඩිතුවක්කු විසින් සහතික කරන ලද 2018.10.03 දිනැති බැඳුම්කර අංක 210 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ **2022ක් වූ අගෝස්තු මස 18 වැනි දින පෙ. ව. 11.30ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව කොළඹ 03, ගාලු පාර, අංක 90 හි පිහිටි සෙලාන් බැංකුව පීඑල්සී පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත්කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කය තුළ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ වෙන්නප්පුව මහ නගර සභා සීමාව තුළ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ අංක 485 නැගෙනහිර

නයිනමඩම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නයිනමඩම පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. සුමිත් ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 2018.07.19 දිනැති අංක 6785 සැලැස්මේ නිරූපණය වන බේරුවේවත්ත හෙවත් කඳුරුගහවත්ත නැමැති ගස් වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ලොට් 1 ලෙස ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටයි දශම අටයි තුනක් (රූ. 1ː පර්. 8.83) විශාල ඉඩම

*දේපළට පිවිසීම* :- කොච්චිකඩේ සිට හලාවත දෙසට 4.5km ගොස් දකුණට හැරී නයිනමඩම පල්ලිය දක්වා මීටර් 300ක් වික්සෝප දේව මාතා පාර දක්වා පැමිණි පසු වම් පසින් වන්නට මෙම දේපල පිහිටා ඇත. (පල්ලියට පිටුපසින්).

*යෝජනා සම්මුති දැන්වීම* :- 2021.02.12 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* ද, ''සිලෝන් ටුඩේ, ''දිනමිණ'' සහ ''තිනකරන්'' පුවත්පත්හි 2021.01.13 දින ද පළවී ඇත.

